# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education – NWP 21 S 1
## සිංහල භාෂාව හා සාහිත්‍යය -පෙරහුරු පරීක්ෂණය (2023 )

11 ශ්‍රේණිය පත්‍රය 1 කාලය පැ1යි.


- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින්.ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x )ලකුණ යොදන්න.

අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳ ඇති කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ආයතන ප්‍රධානියාට සෑම දෙයක් ම **<u>හරි හතරැස් විදිහට</u>** අවශ්‍ය බව සේවකයෝ කීහ.

   (1) අවශ්‍ය වෙලාවට (2) සමචතුරස්‍රාකාර ව
   (3) අංග සම්පූර්ණ ව (4) අලංකාරවත් ව

2. සමහරුන් අනුන්ගේ **<u>කනිපින්දම්</u>** අසන්නට කැමති නැත.

   (1) කේලම් බස් (2) හිස් වචන
   (3) බොරු වර්ණනා (4) දුක් ගැනවිලි

3. සැකකරුවාගේ **<u>මුනිවත රැකීම</u>** පොලිස් නිලධාරියාගේ විමතියට හේතු විය.

   (1) සිල්වත් වීම (2) නිහඬ ව සිටීම.
   (3) හඬා වැලපීම. (4) බැණ වැදීම.

■ අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. වෛද්‍යවරයාගේ නිල නිවස රෝහල් ...................... පිහිටා තිබීම රෝගීන්ගේ සතුටට හේතු විය.

   (1) පරිගණකයෙහි (2) පරිශ්‍රමයෙහි
   (3) පරිමාණයෙහි (4) පරිශ්‍රයෙහි

5. සාහිත්‍ය උලෙළට .................. පොත් ප්‍රදර්ශනයක් ද සංවිධානය කෙරිණි.

   (1) සාපේක්ෂ ව (2) ප්‍රතිගාමී ව
   (3) සමගාමී ව (4) සාමකාමී ව

6. සංවර්ධනය මැනීමේ ඇතැම් ............................... යල්පැන ගොස් ඇති බව විවේචනය වේ.

   (1) නිර්වචනයන් (2) නිර්බාධකයන්
   (3) නිර්ණායකයන් (4) නිර්මාණයන්

7. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

   (1) යෂ්ඨිය, දෘෂ්ඨිය, විශිෂ්ට, පාපිෂ්ඨ (2) වණිජ, ඛෛය්‍ය, ඡේදනය, මර්ධනය
   (3) කොට්ඨාසය, ප්‍රගමනය, ප්‍රතිඵල, ශීඝ්‍රගාමී (4) විරෝධාර, ලේඛණය, විශ්මය, ආභාෂය

8. විරාගය, චරිතය, මාරුතය, විරැකියාව යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල, කෙටි පාපිල්ල
(2) ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල
(3) කෙටිපාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල
(4) දීර්ඝ ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය, කෙටි පාපිල්ල

9. 'ලවනත' යන පදයෙහි අන්තර්ගත ව්‍යඤ්ජන අක්ෂර වර්ග වනුයේ,

(1) මූර්ධජ හා දන්තජ (2) දන්තජ හා ඕෂ්ඨජ (3) කණ්ඨජ හා මූර්ධජ (4) තාලුජ හා දන්තජ

10. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) සරච්චන්ද්‍ර, සේකර, සුරවීර, සැබිහෙළ (2) ආරච්චි, සිළිදු, පුංචිමැණිකා, බඹුන්
(3) වයඹ, මධ්‍යම, දකුණ, නැගෙනහිර (4) ගාල්ල, දිගන, පොළොන්නරුව, මහනුවර

11 අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) වන්දනාකරුවන්, තැරැව්කරුවෙකු, මවක, ලන්දේසීන්
(2) ගොවියා, නැවියෙකු, හෙදියක, බැතිමත්තු
(3) ලේඛකයෙකු, පාඨකයන්, ශූරියක, ඇතමෙක්
(4) සංචාරකයෝ, කවීහු, රියදුරා, මගියෙක්

12. 'මහල්ලා ද ගමෙන් පැමිණියෙකු විය යුතු ය.' යන වාක්‍යයෙහි 'ගමෙන්' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය (2) සම්ප්‍රදාන විභක්තිය (3) ආධාර විභක්තිය (4) අවධි විභක්තිය

13 'මත් රකුසා' යන්න අයත් වනුයේ,

(1) විභක්ති සමාසයට ය (2) අන්‍යාර්ථ සමාසයට ය
(3) විශේෂණ සමාසයට ය (4) අව්‍ය සමාසයට ය

14. 'නිපුණ + ය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට සකස් වන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) නෛපුණ්‍යය (2) නිපුණය (3) නීපුණ්‍ය (4) නෛපූණ්‍ය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) අව්‍ය සමාස - සුපැහැදිලි, අවමාන, නොමිනිස්, පිළිමල්
(2) තද්ධිත - වකුටු, බොකුටු, දොරටු, කැසටු
(3) නිපාත - මෙන්, තුරු, ගෙන්, වන්
(4) පූර්ව ක්‍රියා - බැස, බිඳ, නැඟ, පැමිණ

16. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) පුත, බෙර ගසව (2) අයෙක් කරුණු විමසති.
(3) ඔබ ආවොත් මම නොයමි. (4) කරත වෙණ ගායනා සරියේ

■ අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳ ඇති කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. එහි ඇති **<u>අවියෝජනීය</u>** බව පුදුම සහගත ය.

(1) අවි ගෙන්වීමට යෝජනා වීම (2) වෙන් කළ හැකි බව
(3) වෙන් කළ නොහැකි බව (4) අසත්‍ය බවින් යුතු වීම

18. **<u>සතතාභ්‍යාසය</u>** නිර්මාණකරුවෙකුට අත්‍යවශ්‍ය වේ.

(1) සත්‍ය ප්‍රකාශ කිරීම. (2) නිවැරදි අභ්‍යාස කිරීම.
(3) නිරතුරු අභ්‍යාස කිරීම. (4) නිර්මාණාත්මක එළි දැක්වීම.

19. ඔහු **<u>සිව්සැට</u>** කලාවන්හි ප්‍රවීණයෙකි.

(1) හතලිස් අට (2) හැට අට (3) සිය දහස (4) හැට හතර

20. දී ඇති වචන ගොනු අතරින් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී <u>නොපවත්නා</u> පද පේළිය ඇතුළත් වරණය තෝරන්න.

(1) මාලය, කරාබුව, පා සලඹ, මුද්ද (2) දැල, බිලී පිත්ත, ඔරුව, කරක
(3) අත්පිස්නය, බිත්ති සැරසිල්ල, පාපිස්ස, අත් ලේන්සුව (4) කියත, පොරොව, පිහිය, කැත්ත

21. එක් එක් පද පේළියේ දක්වා ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) අහස -නුබ, මුහුද -සයුර, වත -සිසි, උපුල් - කුසුම්
(2) නුවන -නැණ, කිරණ -රැස්, ප්‍රවීණ -නිපුණ, ධවල - ශ්වේත
(3) දන්ත -දසන්, නියත -නියම, මිත්‍ර -සබඳ, මහී - මිහි
(4) නිරත -නිතර, අදර -ලවන්, දිනකර -දිනිසුරු, ගුරු - ඇදුරු

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සතුට - තොස, තුට, සොම්නස, සතොස
(2) රන් - කනක, කසුන්, ස්වර්ණ, කාංචන
(3) සඳ - චන්ද්‍ර, සොමි, නිශාකර, දිනපති
(4) සතුරා - පසමිතුරු, පිළිමල්, සතුරු, රුපු

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) වංක - අවංක (2) මල - නිමල (3) ආගමන - නිගමන (4) දේශීය - විදේශීය

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'ඹ' අර්ධ අනුනාසික අක්ෂරයකි. (2) 'කිරිබත්' යනු විශේෂණ සමාස පදයකි.

(3) 'නොහොත්' යනු විකල්පාර්ථ නිපාත පදයකි. (4) 'ගොවියා' යන්නෙහි ප්‍රකෘතිය 'ගොවි' යන්න යි.

25 පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.

(1) ප්‍රාණයට සියලු සත්ත්වයෝ තම ආශා නොකරන්නෝ ය.
(2) භාෂා විනාශයට ප්‍රේමීයෝ භාෂා කටයුතු කරති.
(3) උත්සහවන්තයා ජයග්‍රහණය පෙනි පෙනී පරාජයට කටයුතු කරයි.
(4) සත්‍යවාදියා කිසිවිටෙකත් බොරු නොකිය යි.

■ අංක 26, 27 ප්‍රශ්න යටතේ දක්වා ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. කිසියම් දෙයක් පිළිබඳ හරි අවබෝධයක් නොලබා වැරදි නිගමනවලට එළඹීම

(1) අනුන්ගෙ පානෙන් එළිය බැලීම.
(2) උණු හින්දා බොන්නත් බෑ කිරි හින්දා විසිකරන්නත් බෑ.
(3) අන්ධයෝ අලියා ගැන කීවා වාගේ
(4) මුහුණ සමග තරහ වී නහය කපා ගැනීම.

27. දෙයක් රැකගැනීමට සිටින අයගෙන් ම එයට හානි පැමිණීම

(1)වාහෙ එක්ක තරහට නහය කපා ගැනීම. (2) හොරාට කලින් කෙහෙල් කැන වැට පැන්නලු.
(3)වැටත් නියරත් ගොයම් කා නම් කාට පවසම් ඒ අමාරුව. (4)කොකා බක තපස් රැක්කා වාගේ.

28. පූර්ව රූප සන්ධියට හා පර රූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) යක්කල, කම්මල (2) ලග්ගල, කම්මල
(3) යක්කල, ලග්ගල (4) ලග්ගල, යක්කල

■ අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) සියලු පාසල් දරුවන් විනයගරුක විය යුත්තෝ ය.
(2) ගුරුවරු සමග ශිෂ්‍යයෝ ද දේශන ශාලාවට පැමිණෙති.
(3) අපි අනාගත නායකයෝ වෙමු.
(4) ගායකයන් හා වාදකයෝ වේදිකාවට පැමිණියහ.

30 (1) ළමයි පන්තියට පැමිණ ඇත. (2) මම ශිෂ්‍යයෙක් ලෙස පෙනී සිටියෙමි.
(3) අප දිනන්නේ කවදා ද? (4) අයෙක් හොඳින් පාඩම් කරයි.

31 ■ නිවාස තැනීම ....... දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතු ය.
■ ගම්වැසියෝ ........ක්‍රියාත්මක වූහ.
■ ඔහු ..... ම ඇය ද කැණීමට සහභාගි වූවා ය.
■ අතීත ගැමියෝ සොබාදහම ....... සමීප ව දිවි ගෙවූහ.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) සමග, සඳහා, මෙන්, වහා (2) සඳහා, වහා, මෙන්, සමග
(3) සඳහා, වහා, සමග, මෙන් (4) මෙන්, සඳහා, සමග, වහා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

'ඕන නං එනව. නැත්නං යනවා.'

(1) ඕනි නම් එන්න. නැතිනම් යන්න. (2) අවශ්‍ය නම් එන්න. නැතිනම් යන්න.
(3)අවශ්‍ය නම් පැමිණෙන්න. නැතිනම් යන්න. (4)අවශ්‍ය නම් එන්න. අවශ්‍ය නොවේ නම් යන්න.

33. 'අවසාදිත' යනුවෙන් හඳුන්වන්නේ,

(1) පහසුවෙන් ජලයේ දියවන දේවල් ය.
(2) ජලය මගින් රැගෙන විත් තැන්පත් වුණු ඛනිජ හා කාබනික ස්තරයන් ය.
(3) විපරීත සම්භවයක් සහිත ස්ඵටික තීරු ය.
(4) ශක්තිමත්ව ඇසිරුණු මඩ හෝ මැටි ගල් ය.

34. පහත සඳහන් පද්‍යයේ හතරවන පදය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

සුනෙර මතින් අලළන සඳ කිරි සයුර
ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර
පැතිර උදය ගිරි සිරසින් දිලි නො හැර
.......................................................

(1) මීතුර බලා එව ගඟ දිය රැස් වතුර (2) මීතුර බලා ලව එන සඳ රැස් වතුර
(3) උදයග ගිරි හිසින් පැතිරෙයි රස් වතුර ( 4) මීතුර බලා සැනසෙන් සඳ රැස් වතුර

35. සාහිත්‍ය නිර්මාණකරණයේ දී යමක පවත්නා ස්වාභාවික තත්ත්වය ඉක්මවා උත්කර්ෂයෙන් වර්ණනා කිරීම හඳුන්වන්නේ,

(1) සංකල්ප රූප (2) ස්වභාවෝක්තිය (3) අතිශයෝක්තිය (4) රූපක

36. ‘‘සාහිත්‍ය රස වින්දනය යනු පුද්ගල වේදිතයකි. රසය විඳින තැනැත්තා සහෘදයා ලෙස හැඳින්වේ.‘‘ යන පාඨයේ ‘සහෘදයා‘ යන්නෙන් අදහස් කරන්නේ,

(1) රස විඳින අයෙකි. (2) සමාන හදවතක් ඇත්තෙකි.
(3) රසභාව විඳින අයෙකි. (4) සාහිත්‍යකරුවෙකි.

37 පුරාණ හේන් ගොවිතැන ආශ්‍රිත භාෂාවේ ‘අක්වැස්ස‘ යනු?

(1) හේන් වගාව විනාශ කරන අකල් වර්ෂාව. (2)අස්වනු නෙළන අවධියේ ලැබෙන අධික වර්ෂාව.
(3) හේන ගිනි ලෑමෙන් පසු ලැබෙන ප්‍රථම වර්ෂාව. (4)බීජ රෝපණයෙන් පසු ලැබෙන පළමු වර්ෂාව.

38. වතුර මල, තොරොක්කෝව, මං තනන්නෝ යන කෙටිකතාවල රචකයින් වන්නේ,

(1) ඇරැව්වල නන්දිමිත්‍ර, ර්යුනොසුකෙ අකුතගාවා, මහගම සේකර
(2) මහගම සේකර, ර්යුනොසුකෙ අකුතගාවා, ඇරැව්වල නන්දිමිත්‍ර
(3) ර්යුනොසුකෙ අකුතගාවා, මහගම සේකර, ඇරැව්වල නන්දිමිත්‍ර
(4) ඇරැව්වල නන්දිමිත්‍ර, මහගම සේකර, ර්යුනොසුකෙ අකුතගාවා

39. ‘‘හුණු වටයේ කතාව‘‘ නාට්‍යයේ ඇතුළත් චරිතයක් නොවන්නේ,

(1) ගෲෂා (2) නටාලියා (3) ර්යොහෙයි (4) අසඩක්

40. පහත සඳහන් වාක්‍යයේ අදහසට සමීප අදහස දෙන වාක්‍යය තෝරන්න.

“එකල අලි ඇතුන් පිරිවරා ගත් ප්‍රාදේශීය නායකයෝ ඔවුන්ගේ ධජ සහ ලාංඡන රැගෙන හමුදාව පිරිවරා ගෙන පෙරහැරට එක් වූහ. වර්තමානයේ එය දළදා මාලිගාවේ නිලධාරීන් සහ ගං දහයේ විදානෙලා ඇතුළු ප්‍රාදේශික සුළු නිලධාරීන් පිරිසකට සීමා වී තිබේ.’’

(1) අතීතයේ අලි ඇතුන් පිරිවරා ප්‍රාදේශීය නායකයෝ තමන්ගේ කොඩි, සේසත් ආදිය රැගෙන හමුදාව පිරිවරාගෙන පෙරහැරට සහභාගි වූහ.

(2) අතීතයේ ප්‍රාදේශීය නායකයෝ පෙරහැරට සහභාගි වූයේ තම කොඩි, සේසත් ආදිය දරාගෙන ය. අද ගං දහයේ විදානෙලා හා මාලිගාවේ නිලධාරීන් ඊට සම්බන්ධ වේ.

(3) එකල අලින් ද ඇතුන් ද ප්‍රමුඛ කොටගෙන නායකයෝ පෙරහැරට සහභාගි වූයේ කොඩි, සේසත් සමඟිනි.

(4) එදා ප්‍රාදේශීය පාලකයෝ අලි ඇතුන් පිරිවරා කොඩි, සේසත් ආදිය රැගත් හමුදාව පිරිවරාගෙන පෙරහැරට සහභාගි වූහ.වර්තමානයේ ඊට සහභාගි වන්නේ මාලිගාවෙ නිලධාරීන් හා ගං දහයේ විදානේවරුන් ය.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education – NWP** **21 S 11**

**සිංහල භාෂාව හා සාහිත්‍යය -පෙරහුරු පරීක්ෂණය (2023 )**

**11 සිංහල** **පත්‍රය11** **කාලය පැය 2යි.**

සැලකිය යුතුයි.
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
1 සිට 10 තෙක් ඇති.සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

01

I. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) නුවන (ආ) නුවණ.

II. පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.
අධ්‍යාපන ඇමැතිතුමා විශිෂ්ටයන් ඇගයීමට ලක්කරමින් පුස්ථකාල මණ්ඩලයට අයත් දේසන ශාලාවේ දී කළ කතාවට සියලු දෙනා සතුට පළ කළහ.

III. ඉරි ඇඳි පද අයත් විභක්ති නම් කරන්න.
(අ) **<u>ගුරුවරුන් විසින්</u>** ශිෂ්‍යයෝ ඇගයීමට ලක් කරනු ලැබූහ.
(ආ) දෙමව්පියෝ **<u>දරුවන්ට</u>** අවවාද දෙති.

IV. පහත සඳහන් පද නිවැරදිව විසන්ධි කොට ලියා ඒවා අයත් සන්ධි ප්‍රභේදය ලියන්න.
(අ) ලිග්ගල. (ආ) දැවුරුදු.

V. පහත සඳහන් වාක්‍යාංශයට ගැළපෙන තනි පද ලියා දක්වන්න.
(අ) යකඩවලින් කරන ලද.
(ආ) තමා උපන් දේශයට විරුද්ධව කටයුතු කරන්නා.

VI. පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.
(අ) ස්වාධීන. (ආ) ආරෝහණ.

VII. පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද අයත්ක්‍රියා වර්ග නම් කරන්න.
(අ) ගව්වෙන් ගව්ව දිව මාලිග <u>සැදේවා.</u> (ආ) අම්මා අක්කා ලවා රෙදි <u>සෝදවයි</u>.

VIII. පහත යෙදුම්වල කිසියම් නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවන වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) අබිසෙස් මංගල්‍යය. (අ) ස්වභාව සුන්දරත්වය.

IX. පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවා ලියන්න.
(අ) ඔවුහු නිරතුරුව අප අගය කරති.
(ආ) රත්න ශ්‍රී විජේසිංහයෝ සිය ජීවන අත්දැකීම් ඇසුරින් වස්සානය රචනා කළහ.

X. පරිමිත භාෂා ව්‍යවහාරයේ එන පහත වචන දෙක සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ එන වචන ලියන්න.
(අ) බුඩා. (ආ) හැන්නදි රාළ.

ල.2X10=20

02. පහත දැක්වෙන ආ, ආ ,ඉ ,ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන දෙසිය පනහකට නො අඩු වන සේ රචනයක් ලියන්න වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් යොදන්න.

(අ) පරිගණක තාක්ෂණය මුළු ලොව ම විශ්ව ගම්මානයක් බවට පත්කර හමාර ය. ඒ තුළින් සුවිශාල සෙතක් සමස්ත සමාජයට සිදුවන බව නොරහසකි. පසුගිය වකවානුව තුළ මාර්ගගත අධ්‍යාපන ක්‍රියාවලිය තුළ වඩාත් කාර්යක්ෂම ව අධ්‍යාපනය ඉදිරියට ගෙන යැමට පරිගණකයෙන් ඉටු වූ මෙහෙය කිවයුතු නොවේ. එහෙත් පාසල් දරු දැරියන් අතට පරිගණකය පත්කිරීම නිසා මතු වූ ගැටලු මෙතෙකැයි කියා නිම කළ නොහැක.

(ආ) ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවලට අනුව ලොව ළමා මරණ වැඩි ප්‍රමාණයකට ප්‍රධානතම හේතුව මන්ද පෝෂණය යි. සෑම තත්පර දහයකට වරක් ලොව කොහේ හෝ තැනක ළමා මරණයක් සිදුවේ. මේ සඳහා හොඳ ම විසඳුම ආහාර රටාව වෙනස් කිරීම යි. පෝෂ්‍යදායි ආහාර රටාවක් හඳුන්වා දීම කෙරෙහි විශේෂයෙන් ශ්‍රී ලංකාව ඇතුළු පෙරදිග රටවල අවධානය යොමු විය යුතු ය.

(ඉ) වර්තමාන සමාජයේ දූෂණය හා භීෂණය පැතිරෙමින් පවතී. තුන්වන ලෝක යුද්ධයකට මේ කාලය තුළ ලෝක බලවතුන් අත වනන බව පවතින බිහිසුණු යුද වාතාවරණය සාක්ෂි දරයි. බලලෝභය, වෛරය, පලිගැනීම , අසංවර කම් හා නොමිනිස්කම් මෙයට ප්‍රධාන හේතුවයි. සමාජ දූෂණය හා භීෂණය මඟහරවා ගැනීමට මිනිසුන් තුළ සාරධර්ම වර්ධනය වුවහොත් හැකියාව ලැබෙනු ඇත. පවුල, පාසල, සමාජය ආගමික සිද්ධස්ථාන මූලික වී පිරිහෙන සමාජ සාරධර්ම ඇති කිරීමට මහ පෙන්විය යුතුය.

(ඊ) වර්තමානයේ ශ්‍රී ලංකාවාසීන්ට වින්දනය ගෙන දෙන මාධ්‍ය අතර ටෙලි නාට්‍ය වඩාත් ජනප්‍රිය වී ඇත. නමුත් ඇතැම් ටෙලිනාට්‍ය අපේ සංස්කෘතියට හා සභ්‍යත්වයට මෙන් ම මාපිය දූදරු සබඳතාවලට පවා හානිකර අයුරින් විකාශය කෙරේ.මේ හානිකර තත්ත්වය මඟ හරිමින් අපේ සංස්කෘතිය හා සභ්‍යත්වයට ගැළපෙන, සමාජ සංවර්ධනයට දායක විය හැකි අන්දමේ ටෙලිනාට්‍ය එළි දැක්වීම අද කාලීන අවශ්‍යතාවක් වී ඇත.

ල.25යි

03. පහත සඳහන් ඡේදය වචන 60 - 65 අතර වන සේ සාරාංශ කොට ලියන්න.ඡේදය අවසානයේ වචන ගණන ලියා දක්වන්න.

මානව භාෂාවේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එය සංස්කෘතික වශයෙන් හෝ සාම්ප්‍රදායික වශයෙන් උරුම වීමයි. එමගින් අදහස් කරනු ලබන්නේ භාෂාව යනු ඉගෙන ගනු ලබන හා උගන්වනු ලබන මාධ්‍යයක් බවයි. එය සත්ත්ව සන්නිවේදනයේ දක්නට ලැබෙන සෙසු සන්නිවේදන ක්‍රම මෙන් සහජ වශයෙන් සම්ප්‍රේෂණය වන්නක් නොවේ. දරුවෙක් ඉපදී තුන් මසක් පමණ වන විට ක්‍රමයෙන් හිස ඔසවන්නට පටන් ගනී. අවුරුද්ද පිරීමට පෙර වැටි වැටී නැගිට ඇවිදියි. මේ සියල්ල ඔවුන් සහජයෙන් ලබන දැ ය. දරුවා කිනම් දෙසකට කිනම් රැසකට අයත් ද යන්න මෙහිලා නොවැදගත් ය. මිනිස් ලොව කිනම් දෙසක උපන්න ද මේ ලකුණු සහජයෙන් ම ගෙනෙයි. කථා කිරීමේ හැකියාව ද මිනිසාට ජන්මයෙන් උරුම වූවකි. එහෙත් ඔහුගේ උත්පත්තියේ දී ඔහු කිනම් භාෂාවකට උරුමකම් කියයි ද යන්න උපතින් තීරණය වූවක් නොවේ. ඔහු ඔහුගේ පරිසරයේ ජීවත්වන තම සෙසු සාමාජිකයන් කතාබහ කරන විට ඒ අවට පරිසරයේ භාෂාව තම මවුබස ලෙස හඳුනා ගනියි. මෙයින් ඔහු තම මව්පියන්ගේ බස අහුලා ගන්නා බවක් නො කියවේ.

උපතින් පසු තම මව්පියන් ගෙන් වෙන් වී වැඩීමට සිදු වුවහොත් තම මව් බස ලෙස අහුලා ගනු ලබන්නේ පිටස්තර භාෂාවකි. උදාහරණයක් ලෙස තම මව්පියන් සිංහල බස, මවුබස ලෙස භාවිත කරන්නන් වුව ද තමා ජපන් බස පමණක් කතා කරන පරිසරයක හැදුණු වැඩුණු විට තම මව්බස වන්නේ ජපන් භාෂාව විනා, සිංහල භාෂාව නොවේ. උපතින් පසු තමාට භාෂා පරිසර කිහිපයක ජීවත්වීමට සිදුවුවහොත් තම පරිසරය භාවිත වන සියලු භාෂා අහුලාගෙන දක්ෂ ලෙස තමා සතු බවට පත්කර ගැනීමේ හැකියාව මිනිස් ළදරුවා උරුම කර ගනී. මානව දරුවා සාම්ප්‍රදායික ව ලබා ගත් මෙම හැකියාව ඔහුගේ සංස්කෘතික උරුමය ද වේ. මෙලෙස භාෂාවක් සාම්ප්‍රදායික ව උරුම වීම මනුෂ්‍ය භාෂාවේ දක්නට ලැබෙන සුවිශේෂීතාවයකි.

ල. 10යි

**04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

අපේ පැරණි රජ දරුවන්ගේ ඒකායන අධිෂ්ඨානය වූයේ ශ්‍රී ලංකාව පෙරදිග ධාන්‍යාගාරයක් බවට පත්කොට රටවැසියා සුඛිත මුදිත කිරීම ය. ඒ සඳහා ගංගා, දිය මං හරස්කොට ඇළවේලි පමණක් නොව වැව් තනවා. ජල පහසුව සලසා දෙමින් කෘෂිකර්මාන්තයට මුල්තැන දුන්හ. වරින් වර ඇති වූ විදේශ ආක්‍රමණ හේතු කොටගෙන එම වාරිමාර්ග පද්ධතිය විනාශ මුඛයට පත්විය. බ්‍රිතාන්‍ය පාලන සමයේ පැතිරී ගිය වැවිලි ආර්ථිකය නිසා මේ රටේ යටත්විජිත පාලන යුගය තහවුරු වී අපට අවශ්‍ය ආහාර ඇතුළු පාරිභෝගික ද්‍රව්‍ය සඳහා විදේශවලට අත පෑමට ද මං විවෘත විය.

ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය ලබා ගැනීමෙන් පසු ආරම්භ කරන ලද බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමවලට පදනම් වූ ජලාශ අපේ රටේ සංවර්ධනයට යොදා ගැනීම, යස ඉසුරින් පිරුණු රටක් ගොඩනැංවීම සඳහා පැරණි රජ දරුවන් දැරූ උත්සාහය ඇගයීමක් ලෙස දැක්විය හැකි ය. දීර්ඝ කාලයක් තිස්සේ මහා වනාන්තර විසින් ගිලගෙන සිටින වියළි කලාපය සරුසාර කෘෂිකාර්මික කලාපයක් බවට පරිවර්තනය කිරීම සඳහා නූතන මහා වාරිමාර්ග ව්‍යාපාර මගින් සැලසෙන සේවය අතිවිශාල ය. අපේ රටේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය විදුලි බලය නිෂ්පාදනය ද මේ ව්‍යාපෘතිවල එක් අභිමතාර්ථය කි. මෙහි දී අපේ රටේ ආර්ථික සමෘද්ධිය උදාවනු පමණක් නොව අධික ජනගහනය නිසා ඇතැම් ප්‍රදේශවල උද්ගතවන ප්‍රශ්නවලට විසඳුම් මෙන් ම සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද සැලසෙනු ඇත.

1. පෙර සිටි රාජ්‍ය පාලකයන්ගේ ඒකායන අධිෂ්ඨානය වූයේ කුමක් ද?
2. වාරිමාර්ග පද්ධතිය විනාශ මුඛයට පත්වීමට හේතු වූයේ කුමක් ද?
3. විදේශ රටවලට අතපෑම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
4. ඡේදයේ සඳහන් මහාප්‍රාණ අක්ෂර සහිත වචනයක් සහ උපසර්ග සහිත වචනයක් තෝරා ලියන්න.
5. ශ්‍රී ලංකාව ස්වාධීනත්වය ලබා ගැනීමෙන් පසු ආරම්භ කරන ලද බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමවලට පදනම් වූයේ මොනවා ද?

ල.2 X 5 = 10

05. මත් ද්‍රව්‍ය භාවිතය අද ලොව පුරා ව්‍යාප්ත වී ඇති අතර එය මුළු ලොව වෙලාගත් බූවල්ලෙකු බඳු ය. රටවල් කිහිපයක නිෂ්පාදනය කරන මිනිස් සිරුරට අහිතකර මෙම විවිධ ආකාරයේ මත්ද්‍රව්‍ය මුළු ලෝකය පුරාම ව්‍යාප්ත කර ගැනීමේ රහසිගත ජාලයක් පවතී. ශ්‍රී ලංකාව වැනි දියුණුවෙමින් පවතින රටවල් මෙහි ඉත්තන් බවට පත්ව ඇති අතර සියලු රටවල් එක් වී මෙම උවදුර වළක්වා ගත යුතු ය. ඔබ පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ සංගමයේ ලේකම් යැයි සිතා පළාතේ තරුණ ප්‍රජාව අතර බෙදා හැරීම සඳහා මත්ද්‍රව්‍යවල ආදීනව හා මත් උවදුර වළක්වා ගැනීමේ ක්‍රම දක්වමින් ලියන අත් පත්‍රිකාව සකස් කරන්න. මේ සඳහා වචන සීයක් පමණ සෑහේ.

**නැතහොත්,**

හිඟුරක්ගොඩ ආනන්ද විද්‍යාලයේ කලා සංගමය මෙහෙයවන වාර්ෂික කලා මංගල්‍යය පෙබරවාරි දහ නව වන දින පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇත. එහි දී ඉදිරිපත් කරන වැඩසටහන පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කළ යුතු ය. මෙම සංගමයේ ලේකම් ලයනල් වික්‍රමතිලක ඔබ යැයි සිතා කලා උලෙළෙහි සෑම අංගයක් ම ඇතුළත් කරමින් කාල කළමනාකරණය කෙරෙහි ද සැලකිලිමත් වෙමින් යෝග්‍ය න්‍යාය පත්‍රය පිළියෙල කරන්න.

ල.15 යි

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education – NWP** **21 S 111**

**සිංහල භාෂාව හා සාහිත්‍යය -පෙරහුරු පරීක්ෂණය (2023 )**

**11ශ්‍රේණිය** **පත්‍රය 111** **කාලය පැය 2යි.**

- දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1 2 3 4 ප්‍රශ්නවලටත් 5 6 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමිවන ලකුණු සංඛ්‍යාව 80 කි.
- එකේ සිට 10 තෙක් සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. "නොබව මැනව දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනව."
(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවුරුන්ද?
(ආ) දේවයන් වහන්ස යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ කා හටද?

II. "දිමුතු යසස් වන් කුසුම සරාගේ - නුමුතු සුවඳ මල් පැලඳ සරාගේ".
ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(අ) ..........................................................................................................
(ආ) ..........................................................................................................

III. (අ) සියබස් ලකර කෘතිය කුමන ග්‍රන්ථයක අනුවාදයක් ද?
(අ) සියබස්ලකර කෘතියේ කතුවරයා කවරෙක් ද?

IV. "දැන් ඒවි තැනි බිමට සීතලයි මගෙ සිතට.
වැසි සමේ රෑ ඇඳේ සිහිනයක් වී ඉන්න....."
(අ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් කාව්‍ය කෘතිය කුමක්ද?.........................
(ආ) එම කාව්‍ය කෘතියේ කතුවරයා නම් කරන්න.

V. "ම පුතුන් වැන්නවුන්ට බයෙක් කොයින් ද?"
(අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් ද?
(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතියට මූලාශ්‍ර වූ කෘතිය කුමක්ද?

VI. . "මා කී දේ දෙයියනි බොරුවක් ම නැති - බිම එළිවුණොත් කණු මදු බොහොම ළඟ ඇති."
(අ) ඉහත පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) එම පද්‍ය අයත් වන්නේ කුමන ජන කවි වර්ගයකට ද?

VII. කෝපයෙන් ඔහු දෙස බැල්මක් හෙළූ ඇ නොඉවසිල්ලට පත්වූවා ය.
(අ) ඉහත කොටස ඇතුළත් කෘතිය කුමක්ද?
(ආ) එම කෘතියේ පරිවර්තකයා නම් කරන්න.

VIII. (අ) දෑතේ කරගැට සිඹ සනසන්නට පද්‍ය නිර්මාණය උපුටාගත් කාව්‍ය සංග්‍රහය කුමක්ද?
(ආ)කවි සංග්‍රහයේ රචකයා නම් කරන්න.

IX. "අමුත්තා ඒ සියල්ල තමා ගෙනවුත් තිබූ දිගටි පොතෙහි සටහන් කර ගති."
(අ)ඉහත කොටසේ සඳහන් අමුත්තා කවරෙක් ද?
(ආ)මෙම කොටස ඇතුළත් කෙටි කතාව කුමක්ද?

X. පහත සඳහන් කෘතීන්හි කතුවරු නම් කරන්න.
(අ) ධර්ම ප්‍රදීපිකාව. (ආ)බුත්සරණ.

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

I. "ඇතැම්හු අඟුල්මල් නම අසමින් පළා වලට හෝ වදිති.ගෙට වැද දොර පියා ලා අගුළු හෝ ගන්ති. පලා නොයා හෙන්නාහු පිටි පෑ සිටිති.මහතෙරහු **සරළුවක් හමුූ දූ කෙණෙස්සක් බතුදූ** නො ලබති."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) ඉහත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

II. ගංඉවුරේ අලි ඇට නරි අදිනවා කියලා අනිත් අලි ගඟේ නාන්නෙ නැතුව අරිනවා ද?

(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් කා හට ද?

(ආ) මෙවැනි ප්‍රකාශයක් සිදුකිරීමට හේතු වූ කාරණය කෙටියෙන් ලියන්න.

III. නිබ ද පැසී **පල ලබදෙන** මිහිරඹය. - සුවද විහිද සිටි විලිකුන් කැන් රඹය.

නොමද තැනින් තැන වලු බර **වන රඹ ය**. - එමැ ද වෙහෙර දිලි දුරලන සසර බය

(අ) කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙහි පැවසෙන පරිදි සංසාර භය දුරු කරන්නා වූ විහාරය කුමක්ද?

IV. "මේ රජ්ජුරුවන්ට මා මුත් අනෙක් පිළිසරණක් නැති."

(අ) මෙසේ සිතනු ලබන්නේ කවුරුන් ද? පිහිට විය යුතු යැයි සිතන්නේ කාහට ද?

(ආ) මෙසේ සිතීමට පෙර දැක්වූ උපමා දෙකක් ලියන්න.

V. "ඔහු තමාගේ මුළු අනාගතය ම උකස් කළේය. ගෙවීමට හැකිවේද හැකි නොවේද යන්න නොදැන ම ණය පිළිබඳ ලියකියවිලිවලට අත්සන් තැබුවේය."

(අ) මෙහි සඳහන් ඔහු කවුරුන්ද?

(ආ) ණය ගනු ලබන්නේ කුමක් සඳහා ද?

03 (අ) මහෞෂධ පඬිතුමා ප්‍රඥාවෙන් හා පරාර්ථයෙන් යුතුව කටයුතු කිරීම නිසා මියුළු නුවර රාජ්‍යයත් රට වැසියාත් ආරක්ෂා වූ ආකාරයත්.

(ආ) කේවට්ට චරිතය ස්වාර්ථයෙන් යුතුව කටයුතු කිරීම නිසා චූලනී බ්‍රහ්මදත්ත රජු ඇතුළු පිරිසට අනපේක්ෂිත අවස්ථාවකට මුහුණ දීමට සිදුවූ ආකාරයත්.

ජාතක කතාකරුවා උම්මග්ග ජාතකයේ මනාව නිරූපණය කොට ඇත. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්.**

(අ) සිංහබාහු ගේ චරිතය තුළින් තරුණයෙකුගේ අදහස් හා ක්‍රියාකාරීත්වය නිරූපණය වන අතර.

(ආ) සිංහ සීවලීගේ චරිතය තුළින් පිය සෙනෙහස නිරූපණය වේ.

නිර්දිෂ්ට කොටසින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

04. (අ) අහිංසක අපරාධකරුවෙක් වූ ආකාරයත්,

(ආ) අපරාධකරුවෙකුගේ ක්‍රියාකාරීත්වය නිසා ජන ජීවිත අඩාල වූ ආකාරයත්.

අඟුල්මල් දමන කතාව මගින් මනාව දක්වා ඇත.එක් කොටසකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්.**

මග වැනුම්වලදී කවියා.

(අ) කාව්‍ය උපක්‍රම භාවිතයටත්.

(ආ) විවිධ සමාජ, ආර්ථික තොරතුරු හෙළි කිරීමටත් සමත්කම් දක්වයි.සැළලිහිණි සංදේශයේ ඔබට නියමිත කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් සනාථ කරන්න.

05. ජාතික අභිමානය හා ශ්‍රමාභිමානය මැනවින් යොදා ගනිමින් අතීත ශ්‍රී විභූතිය විදහා දැක්වීමට නිර්මාණකරුවා සමත් වී ඇත. දෑතේ කරගැට සිඹ සනසන්නට නිර්මාණය ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

06. දැඩි වෙහෙසක් දරමින් වැසිකිළි සැකසීමේ ව්‍යාපාරයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා ජය ගනී. මෙම කියමන ඔබට නියමිත පාඩම ඇසුරින් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

07. මුනි සිරිපා පද්‍ය නිර්මාණය සාර්ථක වීමට කවියා යොදාගත් භාෂා ශෛලිය පිළිබඳව උදාහරණ තුනක් දක්වමින් ඇගයීමක් කරන්න.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න